# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ
## (සංශෝධන)

**2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මහජන ආරක්ෂක අමාත්‍යතුමා විසින් 2024 අගෝස්තු මස 08 වන දින
ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජූලි මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[281 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. 30.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ පනත යටතේ වූ වරදක් ශ්‍රී ලංකාව තුළ දී සිදුකරනු ලබන යම් තැනැත්තකුට සහ එසේ සිදුකරන ලද වරදට යටත් වන යම් තැනැත්තකුට ද අදාළ වන පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ කරගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ ධුරය, එකී සාමාජිකයා ඉවත් කිරීම සඳහා කරුණු විභාග කිරීමක් අතරතුර අත්හිටුවීම සඳහා ජනාධිපතිවරයා සතු බලතල ව්‍යවස්ථාදායක සභාවේ පූර්ව අනුමතයට යටත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්, සාමාජිකයකුගේ ඉල්ලීමක් මත කොමිෂන් සභාවේ රැස්වීමක් කැඳවීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ලිඛිතව ඒ පිළිබඳ හේතු දැක්වීමේ අවශ්‍යතාවය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) මාර්ගගත ස්ථානයකට ප්‍රවේශ වීම අක්‍රිය කරන ලෙස අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට දැන්වීම් නිකුත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව සතු බලතල ඉවත් කිරීම වේ; සහ

(ආ) 6 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධන සිදු කිරීම වේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඒ වගන්තියේ විධිවිධාන අදාළ කරගැනීම, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ අදාළ විධිවිධානවලට යටත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මේ පනත යටතේ වැරදි සිදුකිරීම" යන වරද නිර්වචනය කිරීම සඳහා ඒ වගන්තියට අවශ්‍ය සංශෝධන සිදු කිරීම වේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) යම් ඉලක්කගත තැනැත්තකුගේ යම් පෞද්ගලික සන්නිවේදනයක් පළ කිරීම මගින් ඒ ඉලක්කගත තැනැත්තාට හිරිහැර කිරීමේ චේතනාවෙන් සන්නිවේදනය කරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් ද ඒ වගන්තියේ විධිවිධාන අදාළ වීම ව්‍යාප්ත කිරීම වේ; සහ

(ආ) දෙවන වරට හෝ තදනන්තරව කරන ලද වරදකට වරදකරු කිරීමට අදාළ දඬුවම ඉවත් කිරීම වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, යම් තැනැත්තකුගේ ප්‍රකාශිත කැමැත්තකින් තොරව ඒ තැනැත්තාට අදාළ අපයෝජන ස්වභාවයෙන් යුතු හෝ කාමෝද්දීපන ස්වභාවයෙන් යුතු ඡායාරූප, හඬපට හෝ වීඩියෝපට මාර්ගගතව පළ කිරීම සඳහා ද ඒ වගන්තියේ විධිවිධාන අදාළ වීම ව්‍යාප්ත කිරීම වේ.

*12 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද, ඒ අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත" යන වචන ඉවත් කිරීම වේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද, ඒ අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත" යන වචන ඉවත් කිරීම වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "ව්‍යාජ මාර්ගගත ගිණුමක්" යන වචන ඉවත් කිරීම වේ.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඒ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන වගකීමෙන් නිදහස් කිරීම ප්‍රදානය කරනු ලබන්නේ කවර තැනැත්තන් සම්බන්ධයෙන් ද, ඒ පුද්ගල කාණ්ඩවල විෂය පථය පුළුල් කිරීම වේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ඒ වගන්තියේ (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින තැනැත්තන්ට දණ්ඩන නියම කිරීමට අධිකරණයට හැකියාව ලබාදෙන විධිවිධාන ඉවත් කිරීම වේ;

(ආ) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා සාධාරණ ප්‍රායෝගික පියවර ගැනීමේ වගකීමක් අන්තර්ජාල සේවා සපයන්නන් සහ අන්තර්ජාල අතරමැදියන් මත පැනවීම වේ; සහ

(ඇ) කොමිෂන් සභාවේ විධානවලට අනුකූලව කටයුතු කිරීමේ දී, සාධාරණ සැළකිල්ලකින් සහ සද්භාවයෙන් යුතුව කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වන සිවිල් හෝ අපරාධ වගකීමෙන් අන්තර්ජාල සේවා සපයන්නන් සහ අන්තර්ජාල අතරමැදියන් නිදහස් කිරීම වේ.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඒ වගන්තිය යටතේ දෙවන වරට හෝ තදනන්තරව කරන ලද වරදකට වරදකරු කිරීමට අදාළ දඬුවම ඉවත් කිරීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ඒ වගන්තිය යටතේ දෙවන වරට හෝ තදනන්තරව කරන ලද වරදකට වරදකරු කිරීමට අදාළ දඬුවම ඉවත් කිරීම වේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, යම් අන්තර්ජාල අතරමැදියකු වෙනුවෙන් මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීමට ඒ අන්තර්ජාල අතරමැදියාගේ බලයලත් අනුයෝජිතයකුට හැකියාව ලබා දීම වේ.

***20 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, විමර්ශනවලට අදාළ විධිවිධානවල පැහැදිලි බව වැඩි කිරීම සඳහා සහ එවැනි විමර්ශන අතරතුර දී ලැබෙන තොරතුරු පිළිබඳ රහස්‍යභාවය පවත්වාගෙන යාම සඳහා විධිවිධාන හඳුන්වා දීම වේ.

***21 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරනු ලබන වැරදි සම්බන්ධයෙන් ද ඒ වගන්තියේ විධිවිධාන අදාළ වීම ව්‍යාප්ත කිරීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට අදාළ වන චර්යා සංග්‍රහයන් නිකුත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාවට හැකියාව ලබා දීම වේ.

***23 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) "අසත්‍ය ප්‍රකාශය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ විෂය පථයෙන්, සද්භාවයෙන් කරන ලද රූපයකයක් බැහැර කිරීම වේ; සහ

(ආ) "ව්‍යාජ මාර්ගගත ගිණුම" යන යෙදුමේ අර්ථ නිරූපණයේ පැහැදිලි බව වැඩි කිරීම වේ

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන)

එල්.ඩී.-ඕ. 13/2024

**2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2024 අංක  දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතේ 2 වන වගන්තිය, ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

2024 අංක 9 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ඇ) තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ වරදක් ශ්‍රී ලංකාව තුළ දී යම් තැනැත්තකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අවස්ථාවක දී,".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "ජනාධිපතිවරයා විසින්" යන වචන වෙනුවට, "ව්‍යවස්ථාදායක සභාවේ අනුමතයට යටත්ව, ජනාධිපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "නිසි හේතුවක් මත මිස," යන වචන වෙනුවට, "එකී සාමාජිකයා වෙත ලිඛිතව දැනුම් දෙන ලද නිසි හේතුවක් මත මිස," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව යටතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "13 වන වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (එ) ඡේදයේ "ශ්‍රී ලංකාව තුළ සිටින" යන වචන වෙනුවට, "මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි, ශ්‍රී ලංකාව තුළ සිටින" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ" සහ "වෙනත් යම් අදාළ ලිඛිත නීතියක්" යන වචන වෙනුවට පිළිවෙළින්, "1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 49 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ" සහ "අධිකරණයට අපහාස කිරීමේ වරද සම්බන්ධයෙන් වන වෙනත් යම් අදාළ ලිඛිත නීතියක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණයට අපහාස කිරීමේ වරද අසා, විභාග කොට නිශ්චය කිරීමේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 55 වන වගන්තිය හෝ අධිකරණයට අපහාස කිරීමේ වරද සම්බන්ධයෙන් වන වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාරව උචිත අධිකරණයක් සතු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ඉවත් කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ -

(අ) "වංචා කරන," යන වචන වෙනුවට, "මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලබන," යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ""අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මාර්ගගතව වංචා කිරීමේ වරද සිදු කරන අතර," යන වචන වෙනුවට, "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මේ පනත යටතේ වරදක් සිදු කරන අතර," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) "වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ විට මේ පනත යටතේ එකී තැනැත්තා වෙත පනවනු ලබන වෙනත් යම් දඬුවමකට අමතරව, වසර තුනක් දක්වා" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මේ පනත යටතේ වැරදි සිදු කිරීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

"හිරිහැර සිදු කිරීම සඳහා ප්‍රකාශ සන්නිවේදනය කිරීම ආදිය

**20.** (1) (මේ වගන්තියේ "ඉලක්කගත තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකුට හිරිහැර කිරීමේ චේතනාවෙන්, ඉලක්කගත තැනැත්තාගේ හෝ ඉලක්කගත තැනැත්තාට සම්බන්ධ තැනැත්තකුගේ යම් පෞද්ගලික තොරතුරක්

හෝ යම් ආකාරයක පෞද්ගලික සන්නිවේදනයක් පළ කිරීමෙන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉලක්කගත තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට හිරිහැරයක් සිදු කරවන ප්‍රකාශයක් සිතාමතා ම සිදු කරන හෝ සන්නිවේදනය කරන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා -

(අ) "හිරිහැර කිරීම" යන්නෙන්, යම් තැනැත්තකුට තර්ජනය කිරීමේ, තැති ගැන්වීමේ හෝ පීඩාවට පත් කිරීමේ හෝ යම් තැනැත්තකුගේ අභිමානය උල්ලංඝනය කිරීමේ හෝ බියගන්වනසුළු, අවමන් සහගත, එදිරිවාදී, නින්දා සහගත හෝ වරදකාරී පරිසරයක් නිර්මාණය කිරීමේ බලපෑමක් ඇති හෝ ඒ සියලු බලපෑම් ඇති යම් ක්‍රියාවක් හෝ හැසිරීමක් අදහස් වේ;

(ආ) "පෞද්ගලික සන්නිවේදනය" යන්නෙන්, යම් තැනැත්තකු විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි දුරකථනය හරහා වන සන්නිවේදනයක් හෝ වෙනත් යම් වාචික සන්නිවේදනයක්, යම් සමාජ මාධ්‍ය වේදිකාවක් හරහා සිදු කරන සන්නිවේදනයක් හෝ යම් ඩිජිටල් මාධ්‍ය වේදිකාවක් හරහා සිදු කරන යම් සන්නිවේදනයක් ඇතුළු යම් සන්නිවේදනයක් අදහස් වන නමුත් ඊට වෙනත් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි විය හැකි යම් තොරතුරක් ඇතුළත් නොවේ; සහ

(ඇ) "පෞද්ගලික තොරතුරු" යන්නෙන්, යම් තැනැත්තකු විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු

ලැබිය හැකි යම් ඡායාරූපයක්, හඬ පටයක හෝ වීඩියෝ පටයක විස්තර ඇතුළු පුද්ගලික තොරතුරු අදහස් වන නමුත් එයට වෙනත් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි විය හැකි යම් තොරතුරු ඇතුළත් නොවේ.

<u>නිදර්ශන</u> -

(අ) "එක්ස්" සහ "වයි" අතර මින් පෙර සම්බන්ධතාවයක් පැවතිය ද දැන් එම සම්බන්ධතාවය අවසන් වී ඇත. "වයි" හට හිරිහැර කිරීමේ අදහසින්, වෙනත් තැනැත්තන්ට "වයි" හඳුනාගැනීමට පහසුකම් සලසමින් හෝ "වයි" සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි "වයි" ගේ ඡායාරූප සහ පෞද්ගලික ජංගම දුරකථන අංකය ඇතුළත් කරමින්, "එක්ස්" විසින් සමාජ මාධ්‍ය වේදිකාවක පළ කිරීමක් ලියනු ලබයි. "වයි" පළ කිරීම නොදුටු නමුත් (ඒ පළ කිරීම කියවන ලද) නන්නාඳුනන තැනැත්තන්ගෙන් ලිංගික කටයුතුවලට එක්වන ලෙසට යෝජනා කරමින් දුරකථන ඇමතුම් සහ කෙටි පණිවුඩ සේවාව හරහා කෙටි පණිවුඩ ලැබෙන අතර, එමගින් " වයි" හිරිහැරයට පත් වේ. ඒ පළ කිරීමට අදාළව මේ වගන්තිය යටතේ "එක්ස්" වරදකට වරදකරු වේ.

(ආ) "එක්ස්" හා "වයි" අතර මින් පෙර සම්බන්ධතාවයක් පැවතිය ද දැන් එම සම්බන්ධතාවය අවසන් වී ඇත. පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ තැනැත්තකු විසින් අපේක්ෂා කරනු ලබන, "එක්ස්" සන්තකයේ ඇති "වයි" ගේ ඡායාරූපයක් "එක්ස්" විසින් පළ කරනු ලබයි. ඒ පළ කිරීමට අදාළව, මේ වගන්තිය යටතේ "එක්ස්" වරදකට වරදකරු වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2අ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා, යම් තැනැත්තකුගේ ප්‍රකාශිත කැමැත්තකින් තොරව, එකී තැනැත්තාට අදාළව අපයෝජන ස්වභාවයෙන් යුතු හෝ කාමෝද්දීපන ස්වභාවයෙන් යුතු යම් ඡායාරූපයක්, හඬ පටයක් හෝ වීඩියෝ පටයක් පළ කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර දෙකකට නොඅඩු සහ වසර දහයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "සමාජ මාධ්‍ය ගිණුම වෙත හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද, ඒ අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත යවනු ලැබීමෙන්" යන වචන වෙනුවට, "සමාජ මාධ්‍ය ගිණුම වෙත යවනු ලැබීමෙන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ "ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ" යන වචන වෙනුවට, "ඉල්ලා සිටිමින් ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ" යන වචන ආදේශ කිරීමෙන්.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය, ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "සමාජ මාධ්‍ය ගිණුම වෙත හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද, ඒ අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත හෝ යවනු ලැබුවහොත්," යන වචන වෙනුවට, "සමාජ මාධ්‍ය ගිණුම වෙත යවනු ලැබුවහොත්," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ව්‍යාජ මාර්ගගත ගිණුමක්" යන වචන වෙනුවට, "යම් මාර්ගගත ගිණුමක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් සේවාවන් සැපයීමේ නිරතව සිටින යම් තැනැත්තකු," යන වචන වෙනුවට, "පහත සඳහන් සේවාවන් සැපයීමේ නිරතව සිටින යම් තැනැත්තකු," යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "අන්තර්ජාල සේවා සපයන්නකු" යන වචන වෙනුවට, "සේවා සපයන්නකු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "තෝරා ගනු ලැබ ඇත්නම්;" යන වචන වෙනුවට, "තෝරා ගනු ලැබ ඇත්නම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "වෙනස් කරනු ලැබ ඇත්නම්; හෝ" යන වචන වෙනුවට, "වෙනස් කරනු ලැබ ඇත්නම්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය, ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(6) මේ පනත යටතේ, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයකට අදාළව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූල වීම පිණිස සාධාරණ ලෙස ප්‍රායෝගික වන සියලු පියවර ගැනීම සඳහා අන්තර්ජාල සේවා සපයන්නකුට හෝ අන්තර්ජාල අතරමැදියකුට වගකීමක් ඇත.

(7) අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු හෝ එකී අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ නිලධරයකු, සේවානියුක්තයකු හෝ නියෝජිතයකු, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් දෙන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමේ දී සාධාරණ සැලකිල්ලකින් යුතුව සහ සද්භාවයෙන් යුතුව කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ප්‍රකාශයට පත්කරන ලද මාර්ගගත ස්ථානයකට අදාළව ගත යුතුව තිබූ යම් පියවරක් ගැනීම සම්බන්ධයෙන් එකී තැනැත්තා සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකට යටත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය, එහි "රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙක ම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට, "රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය, එහි "රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙක ම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට, "රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම*

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය, ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ "ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, ඒ ආඥාව කරනු ලබන දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත, ඒ ආඥාව කරනු ලබන මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිට" යන වචන වෙනුවට, "ඒ ආඥාව කරනු ලබන දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත, ඒ අන්තර්ජාල අතරමැදියා විසින් ඒ ආඥාව කරනු ලබන මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිට හෝ ඒ අතරමැදියා වෙනුවෙන් ඒ ආඥාව කරනු ලබන මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීම සඳහා අනුයෝජිතයකුට නිසි පරිදි බලය පැවරීමෙන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම*

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ -

(අ) "විශේෂඥයකුට" යන වචනය වෙනුවට, "විශේෂඥයකුට, උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු විසින් ඒ කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, මහෙස්ත්‍රාත්වරයකු විසින් තත්කාර්යය සඳහා නිකුත් කරනු ලබන සෝදිසි වරෙන්තුවක අධිකාරය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "ඇතුළුවීමට;" යන වචනය වෙනුවට, "ඇතුළුවීමට; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ප්‍රවේශ වීමට;" යන වචන වෙනුවට, "ප්‍රවේශ වීමට." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) ඒ උපවගන්තියේ (ඇ), (ඈ) සහ (ඉ) ඡේද ඉවත් කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(4අ). මේ පනත යටතේ වන විමර්ශනයක කාර්යය සඳහා, පොලීසියට සහාය වීමට කැඳවන ලද විශේෂඥයකු විසින්, උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු විසින් ප්‍රදානය කරන ලද අධිකාරය යටතේ-

(අ) ඒ විමර්ශනයේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි යම් ලේඛනයක්, තොරතුරක්, උපාංගයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙසට යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය;

(ආ) යම් හුවමාරු වන දත්ත හෙළිදරව් කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය;

(ඇ) යම් තැනැත්තකු වාචිකව ප්‍රශ්න කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) මේ පනතේ කාර්ය සඳහා, සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි වෙනත් යම් දේ සිදු කරනු ලැබිය හැකි ය."; සහ

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(7) මේ පනත යටතේ යම් විමර්ශනයක නිරත ව සිටින සෑම තැනැත්තකු විසින් ම, ඒ විමර්ශනය අතරතුර තමාට දැනගැනීමට ලැබෙන සියලු තොරතුරු සම්බන්ධයෙන් දැඩි රහස්‍යභාවයක් පවත්වාගත යුතු අතර, ඔහු විසින්, මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ප්‍රමාණයට හැර, තමාට දැනගැනීමට ලැබුණු තොරතුරු යම් තැනැත්තකුට හෙළිදරව් කිරීම හෝ කවරාකාරයේ හෝ යම් කාර්යයක් සඳහා භාවිත කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(8) යම් දත්ත හෝ වෙනත් යම් තොරතුරු හෙළිදරව් කිරීම සඳහා බැඳී සිටින යම් අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු හෝ වෙනත් යම් තැනැත්තකු, මේ පනත යටතේ වන යම් විමර්ශනයක කාර්යය සඳහා එකී යම් දත්ත හෝ වෙනත් තොරතුරු හෙළිදරව් කිරීම හේතුවෙන් සිවිල් හෝ අපරාධ වරදකට යටත් කරනු නොලැබිය යුතු ය.

(9) (7) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, වසර දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනත" යන වචන වෙනුවට "13 වන වගන්තිය යටතේ සිදු කරන ලද යම් වරදක් හැර, මේ පනත" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(3) ශ්‍රී ලංකාවේ දේශයෙන් පිටත සිදු කරන ලද යම් වරදක් සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන අදාළ කරගැනීමේ කාර්ය සඳහා, ඒ වරද ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද වරදක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"කොමිෂන් සභාව විසින් රීති ආකාරයෙන් චර්යා සංග්‍රහය සාදනු ලැබිය යුතු බව

**49.** කොමිෂන් සභාව විසින්, පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් (2) වන හෝ (3) වන උපවගන්ති යටතේ සකස් කරන ලද අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට අදාළ චර්යා සංග්‍රහයන් රීති ආකාරයෙන් නිකුත් කරනු ලැබිය යුතු ය:-

(අ) වෛරී කථනය, ප්‍රචණ්ඩත්වය සඳහා පෙළඹවීම, වැරදි තොරතුරු, සාවද්‍ය තොරතුරු, සයිබර් බියගැන්වීම් සහ හිරිහැර

කිරීම් සහ මාර්ගගතව අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම සහ අපයෝජනය ඇතුළු පීඩාකාරී මාර්ගගත අන්තර්ගතයන් සහ හැසිරීම් ආමන්ත්‍රණය කිරීමට;

(ආ) සමායෝජිත ව්‍යාජ හැසිරීම් සහ වෙනත් යම් මාර්ගගත ගිණුම් අවභාවිත කිරීම් හඳුනාගැනීම, පාලනය කිරීම සහ එයට එරෙහිව ආරක්ෂාව සැලසීමට;

(ඇ) මෙහෙයුම් ප්‍රමිතීන් සකස් කිරීම සහ පීඩාකාරී අන්තර්ගතයන් සීමා කිරීම සඳහා ගෙන ඇති ප්‍රගාමී ක්‍රියාමාර්ග විනිවිදභාවයෙන් යුතුව වාර්තා කිරීමට;

(ඈ) අන්තර්ජාල අතරමැදියන් වර්ග නියම කිරීමට ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ සන්නිවේදනය කරන ලද දේශපාලන අරමුණක් වෙත යොමු වූ, යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක් සම්බන්ධයෙන් එහි අනුග්‍රාහකයා සහ වෙනත් තොරතුරු හෙළිදරව් කිරීම වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අන්තර්ජාල අතරමැදියන් නියම කිරීමට; සහ

(ඊ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලවීම සඳහා වන කාලසීමාව නිශ්චිතව දැක්වීමට.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් ඒ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට මාස තුනක් ඇතුළත, (1) වන උපවගන්තියේ (අ) සිට (ඊ) දක්වා වූ කාරණා සම්බන්ධයෙන් වන චර්යා සංග්‍රහයක් ස්වේච්ඡා පදනමකින් සකස් කිරීම සඳහා, අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට අවස්ථාව ලබා දෙනු ලැබිය යුතු ය.

(3) අන්තර්ජාල සේවා සපයන්නන් සහ අන්තර්ජාල අතරමැදියන් විසින් -

(අ) (2) වන උපවගන්තියේ සඳහන් මාස තුනක කාලසීමාව ඇතුළත ස්වේච්ඡා පදනමකින් චර්යා සංග්‍රහයක් සකස් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී; හෝ

(ආ) කොමිෂන් සභාව සමඟ එක් ව චර්යා සංග්‍රහයක් සකස් කිරීම සඳහා වන ස්වකීය කැමැත්ත කොමිෂන් සභාව වෙත සන්නිවේදනය කරනු ලබන අවස්ථාවක දී,

කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද කාරණා සම්බන්ධයෙන් එකී චර්යා සංග්‍රහය සකස් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් (3) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කිරීමෙන් පසුව, මාස තුනකට නොඅඩු කාලසීමාවක් ඇතුළත ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වූ චර්යා සංග්‍රහයේ කෙටුම්පත පළ කර, අන්තර්ජාල සේවා සපයන්නන්ගෙන් සහ අන්තර්ජාල අතරමැදියන්ගෙන් ඔවුන්ගේ අදහස්, නිරීක්ෂණ සහ නිර්දේශ ලබා ගැනීම සහ චර්යා සංග්‍රහයේ කෙටුම්පත ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්ජාල සේවා සපයන්නන්ගේ සහ අන්තර්ජාල අතරමැදියන්ගේ එකඟතාවය සහ සම්මතිය ලබා ගැනීමට පියවර ගැනීම කොමිෂන් සභාවේ කාර්යය විය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් (4) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකිරීමෙන් පසුව, (1) වන උපවගන්තිය යටතේ චර්යා සංග්‍රහය නිකුත් කිරීමට පෙරාතුව මාස තුනක කාල සීමාවක් සඳහා චර්යා සංග්‍රහයේ කෙටුම්පත පිළිබඳව මහජන අදහස් විමසීමක් පැවැත්වීම සඳහා කොමිෂන් සභාව විසින් පියවර ගනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ සකස් කර ගැසට්පත්‍රයේ පළ කරන ලද චර්යා සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම අන්තර්ජාල සේවා සපයන්නන්ගේ සහ අන්තර්ජාල අතරමැදියන්ගේ කාර්යය විය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැති ව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ, 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) “අසත්‍ය ප්‍රකාශය” යන යෙදුමේ අර්ථ නිරූපනයෙහි “අධ්‍යාරෝපණයක්” යන වචනය වෙනුවට “අධ්‍යාරෝපණයක් හෝ සද්භාවයෙන් කරන ලද රූපකයක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) “ව්‍යාජ මාර්ගගත ගිණුම” යන යෙදුමේ අර්ථ නිරූපනයෙහි “ඒ මාර්ගගත ගිණුමේ හිමිකම් දරන්නාගේ අනන්‍යතාව” සහ “නොමඟ යැවීමේ කාර්යය සඳහා” යන වචන වෙනුවට පිළිවෙලින්, “මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමේ කාර්යය සඳහා, ඒ මාර්ගගත ගිණුමේ හිමිකම දරන්නාගේ අනන්‍යතාව” සහ “නොමඟ යැවීමට” යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.